**සීමාසහත කොළඹ කොමර්ෂල් පොහොර සමාගම**

# 1 මූල්‍ය ප්‍රකාශන

-----------------

## 1.1 මතය

--------

මෙම වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් සහ නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති සීමාසහිත කොළඹ කොමර්ෂල් පොහොර සමාගමේ 2010 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට මට නොහැකිය.

## 1.2.1. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

## 1.2.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය

--------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය ප්‍රකාරව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2010 නොවැම්බර් 22 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි.

## 1.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

---------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු.58,390 ක් වටිනා කාර්යාල උපකරණ අපහරණය කිරීමෙන් ඇති වූ රු. 36,839 ක අලාභය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ගලපා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 09 ට අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ කාරක ප්‍රාග්ධන වෙනස්වීම යටතේ ජංගම වගකීම් වල වෙනස්වීම ලෙස රු. 17,465,554,543 ක් දක්වා තිබුණද ජංගම වගකීම්වල වෙනස්වීම් වටිනාකම රු.9,118,328,203 ක් විය.

### 1.2.3 ගිණුම්කරණ ප්‍රතිපත්ති

-------------------------

ආයතනයේ අඩමාන ණය ප්‍රතිපතතිය ලෙස අවුරුදු 1 ට වඩා වැඩි සියළුම ණයගැති ශේෂයන් සඳහා 0.1% ක අඩමාණ ණය ප්‍රතිපාදනයන් සලසා තිබුණි.ඒ අනුව රු.36,368,221 ක් වූ අවුරුදු 05ට වැඩි කාලයක සිට පැවතෙන ණයගැතියන් සඳහාත් රු.10,459,949 ක් වූ අවුරුදු 01 - 05 අතර කාල පරාසයක වූ ණයගැතියන් සඳහාත් එකම ප්‍රතිශතයකින් අඩමාන ණය ප්‍රතිපාදන සලසා තිබුණි.

### 1.2.4 ගණම්කරණ අඩුපාඩු

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008/2009 ගිණුම් වර්ෂයේදී ආනයනය කරන ලද පොහොර වෙනුවෙන් ලැබිය යුතු සහනාධාර වටිනාකම රු.749,308,371 ක් නිසි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී ලාභයට ලිහා හැර තිබුණත් එම වටිනාකමින් රු.595,000,000 ක් 2009/2010 වර්ෂය තුළදී සමාගම වෙත ප්‍රතිපූර්ණය කර තිබුණි.

(ආ) (i) බස්නාහිර පළාත් සභාවට අදාළව විකුණුම් වටිනාකම මත පිරිවැටුම් බදු ප්‍රමාණය රු. 3,993,409 ක් වුවත් ගිණුම්ගත කර තිබූ ප්‍රමාණය රු. 4,154,587 ක් වූයෙන් රු. 161,178 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.

(ii) පළාත් සභා 03 ක් වෙනුවෙන් ගෙවිය යුතු එකතුව රු 1,262,902 ක් වු පිරිවැටුම් බදු වෙනුවෙන් ගිණුම්වල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

### 1.2.5 නිරවුල් නොකළ ශේෂ

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2001වර්ෂයේ සිට 2008 වර්ෂය දක්වා කාලයට අදාළ රු. 235,574 ක් වූ අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පොහොර සමාගම සතු බැංකු ගිණුම් දෙකකට අදාලව රු.1,844,095 ක හඳුනානොගත් බැර ශේෂ විය. 2007, 2008 හා 2009 වර්ෂවලට අදාලවූ මෙම බැර ශේෂ අතර පොහොර සඳහා වූ ලැබීම් රු.1,305,060 ක් තිබුණද ඒවා හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.2.6 පැහැදිලි නොකළ වෙනස්කම්

--------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ණයගැති ලෙජරයට අනුව ණයගැතියන් 04 කගේ ශේෂය රු.1,131,995 ක් වුවත් ශේෂ සනාථ කිරීම් අනුව එම ශේෂය රු. 310,799 ක් වූයෙන් රු. 821,196 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත ගිණුම් කාලපරිච්ඡේදයට අදාළ තොග සැසඳුම අනුව ලැබුණු විකුණුම් ප්‍රමාණය මෙට්‍රික් ටොන් 140,897.018 ක් වුවත් විකුණුම් ගිණුමේ දක්වා ඇති ප්‍රමාණය මෙට්‍රික් ටොන් 142,728.155 ක් වූයෙන් මෙට්‍රික් ටොන් 1,831.137 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 1.2.7 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

--------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 05 ට වැඩි ණයගැතියන් 67 දෙනෙකුට අදාළ අය නොවන ණය ශේෂ වල රු.36,368,221 ක් විය.

(ආ) වර්ෂ 04 කට වැඩි කාලයක සිට පැවත එන නොපියවූ ඉදිරි ගෙවීම් ශේෂය රු. 179,446 ක් විය.

### 1.2.8 විගණනය සඳහා සාක්ෂි නොවීම්

--------------------------------------

එක් එක් විෂයය ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම හේතුවෙන් ගිණුම්වල දක්වා ඇති පහත දැක්වෙන විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

| ගිණුම් විෂයය | වටිනාකම රු. | ඉදිරිපත් නොවූ සාක්ෂි |
|---|---|---|
| (අ) ඉඩම් | 90,000,000 | අයිතිය තහවුරු කිරීම සඳහා ඔප්පු හෝ වෙනත් ලියකියවිලි. |
| (ආ) ණය ගැතියන් (වර්ෂ 05 කට වැඩි) | 35,235,955 | ශේෂ සනාථ කිරීම්. |

## 1.2.9 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

---

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| <u>නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව</u> | <u>විස්තර</u> |
|---|---|
| (අ) 1996 අංක 29 දරන රාජ්‍ය ව්‍යවසායන් ප්‍රතිසංස්කරණ පනත | පනත අනුව නිසි බලධාරී තනතුර මාස 06 කට වලංගු වන අතර, එම කාලය 1997 මැයි 11 දිනෙන් අවසන් වී තිබුණි. ඒ අනුව සමාගමේ නිසි බලධාරී තනතුර සඳහා නිසි අධිකාරී බලයක් නොමැති බව නිරීක්ෂණය විය. |
| (ආ) රජයේ මුදල් රෙගුලාසි | |
| (i) මු.රෙ. 113 | 2007 වර්ෂයේදී වර්ෂ 13ක් පමණ කාලයක සිට අය කර ගත නොහැකිවූ ණයගැතියන් 72 කට අදාළ රු. 60,585,398ක් වූ ණය ශේෂ කපාහැරීමට භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ii) මු.රෙ. 135 | ආයතනය තුළ විධිමත් පරිදි තනතුරු සඳහා බලතල හා රාජකාරී පැවරීම් සිදුකර නොතිබුණි. |
| (iii) මු.රෙ. 387 | ආයතනය විසින් බැංකු අයිරා පහසුකම් ලබාගෙන තිබුණ අතර ඒ වෙනුවෙන් රු.8,833,269 ක් පොළී වශයෙන් ගෙවා තිබුණි. |
| (ඇ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | |
| (i) 7.4.2 වගන්තිය | පරිපාලන ආයතනික හා මෙහෙයුම් තීරණ ගැනීමට සහ ක්‍රියාත්මක කරවීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කමිටුවක් තිබිය යුතු වුවත්, එවැනි කමිටුවක් පිහිටුවා නොතිබුණි. |
| (ii) 8.3.3 වගන්තිය | වාර්ෂික ප්‍රසාද දීමනා හා දිරි දීමනා ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගත යුතු අතර ආයතනයේ පෙර වර්ෂයේ මූල්‍ය |

ප්‍රකාශන විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර පාර්ලිමේන්තුවේ සභාගත කර තිබිය යුතුය. එහෙත් එසේ කටයුතු නොකර සමාලෝචිත වර්ෂය තුළදී රු. 7,621,242 ක මුදලක් දීමනා ලෙස ගෙවීම් කර තිබුණි.

(iii) 8.7 වගන්තිය

ජේදයේ දැක්වෙන විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී සේවකයන් වෙනුවෙන් වූ රු. 262,116 ක උපයන විට ගෙවීම් බදු සමාගම විසින් දරා තිබුණි.

(iv) 9.2 ඒ,බී,සී හා ඩී වගන්තිය

ආයතනය සඳහා වන කාර්යය මණ්ඩල අවශ්‍යතා සැලැස්මක්, සංවිධාන සටහනක් සහ අනුමත කාර්ය මණ්ඩලයක් තිබිය යුතු අතර සංවිධාන සටහන සහ අනුමත කාර්යය මණ්ඩලය මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කළ යුතු වුවත්, එම නියමයන්ට අනුව කටයුතු කර නොතිබුණි.

(v) 9.11 වගන්තිය

ආයතනයක සේවකයන් විශ්‍රාම ගැන්වීමේ වැඩසටහනකට පසු ඒ හා සමඟම අනුමත සංශෝධිත කාර්ය මණ්ඩලයක් සකස්කර මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර අනුමැතිය ලබාගත යුතු අතර ඒ සමඟ එළඹෙන දෙවසර තුළ නව බඳවා ගැනීම් සිදුකළ නොහැකි නමුත් ආයතනය 2005 වර්ෂයේ සිට මේ දක්වා විවිධ තනතුරු සඳහා නව බඳවා ගැනීම් 73 ක් සිදුකර තිබුණි.

(vi) 9.12 වගන්තිය

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබානොගෙන සුභසාධන වැඩසටහනක් ක්‍රියාත්මක කර තිබුණු අතර සමාලෝචිත වර්ෂය තුළදී ඒ සඳහා රු.219,461 ක මුදලක් වැය කර තිබුණි.

| | |
|---|---|
| (ඇ) 1999 නොවැම්බර් 19 දිනැති අංක පීඑෆ්/පීඊ/ 3 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සමාගමේ විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවා නොතිබුණි. |
| (ඉ) 2006 ජනවාරි 25 දිනැති අංක එන්පීඒ/ 08 දරන රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 9.3.1 (ආ) ඡේදය | රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන රු. 100,000 ට වැඩි මෝටර් වාහන සහ උපකරණ අළුත්වැඩියාව වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. 449,652 ක් වැය කර තිබුණි. |
| (ඊ) 2008 ජුනි 26 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 14/2008 | (i) නිසි බලධාරීට තමන්ගේ පෞද්ගලික වාහනය රාජකාරි කටයුතු සඳහා යොදාගත හැකි වුවද, ඒ වෙනුවෙන් ආයතනය විසින් ගෙවිය හැකි උපරිම මුදල මසකට රු.30,000 ක් බැගින් වර්ෂයකට රු.360,000 කි. එයට පටහැනිව සමාලෝචිත වර්ෂය සඳහා මසකට රු.60,000 ක් බැගින් රු.720,000 ක් ගෙවා තිබුණි. මේ අනුව රු. 360,000 ක් සමාලෝචිත වර්ෂයෙදී වැඩිපුර ගෙවා තිබුණි.<br>(ii) ඉහත දැක්වූ රථයට අමතරව නිසි බලධාරීට නිල රථය සඳහා රියදුරකු හෝ වෙනත් වාහනයක් උපයෝජනය කළ නොහැකි වුවද වරින් වර වෙනත් වාහනයක්ද උපයෝජනය කර තිබූ අතර ඒ සඳහා රියදුරන් කිහිපදෙනෙකුද යොදාගෙන තිබුණි. |
| (උ)ජාතික පොහොර ලේකම් කාර්යාලයේ 2009 ඔක්තෝබර් 30 දිනැති චක්‍රලේඛ අංක 4/5/1 | ණය පදනම මත පොහොර අලෙවි කළ නොහැකි වුවද ඊට පටහැනි ලෙස ණයට විකුණුම් රු.11,590,293 ක් සිදුකර තිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

-------------------------------------

### 2.1 මූල්‍ය සමාලෝචනය

---------------------

#### 2.1.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂයේදී සමාගමේ මෙහෙයුම්වලින් රු.185,780,364 ක ශුද්ධ ලාභයක්වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ පාඩුව රු.42,227,190 ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.228,007,554 ක වර්ධනයක් දැක්වුණි. සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵල විවිධ අදියරයන් යටතේ පහත වගුවෙන් දැක්වේ.

| | | මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | |
|---|---|---|---|
| | | 2010 | 2009 |
| | | රු. | රු. |
| (අ) | දළ ලාභය | 536,229,672 | 151,074,011 |
| (ආ) | බදුවලට පෙර ශුද්ධ ලාභය/අලාභය | 185,809,902 | (40,197,190) |
| (ඇ) | බදුවලට පසු ශුද්ධ ලාභය/ අලාභය | 185,780,364 | (42,227,190) |

#### 2.1.2 මෙහෙයුම් සමාලෝචනය

-----------------------------

#### 2.1.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අවුරුදු 05 ට වඩා වැඩි රු. 25,620,414 ක් වටිනා ණයගැතියන් සම්බන්ධව නීතිමය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ණයගැතියන් 18 දෙනෙකුගේ ණය අය කිරීමේදී ආරම්භක ණයගැති ශේෂය එලෙසම තිබියදී සමාලෝචිත වර්ෂයේ සැපයුම් වටිනාකම පමණක් චෙක්පත් මගින් අය කර ගෙන තිබුණි.

(ඇ) ණයගැතියෙකුගෙන් ලද රු. 228,085 ක් වටිනා 2010 මාර්තු 23 දිනැති අංක 914133 දරන චෙක්පත සමාගම විසින් නියමිත කාලය තුළ බැංකු ගත නොකිරීම නිසා අගරු වී තිබුණි.

(ඇ) නාමල්තලාව ගොවිජන සේවා මධ්‍යස්ථානය විසින් නිකුත් කරන ලද අංක 445179 සහ 445180 දරන පිළිවෙලින් රු. 502,400 සහ රු. 29,450 වටිනාකමින් යුත් චෙක්පත්, ගිණුමේ මුදල් නොමැති බව තහවුරුව තිබියදීත් ආයතනය විසින් එම චෙක්පත් සඳහා පොහොර නිකුත්කිරීමෙන් අනතුරුව එම චෙක්පත් බැංකු ගත කිරීමෙන් පසු අගරු වී තිබුණි.

**2.2.2 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

------------------------------------

පහත නිරීක්ෂණයන කරනු ලැබේ.

(අ) 2007 වර්ෂයේදී හම්බන්තොට ගබඩාවක් ඉදිකිරීම සඳහා සැලසුම් සකස් කිරීම වෙනුවෙන් රු. 253,173 ක මුදලක් වියදම් කර තිබුණද මෙතෙක් එම කටයුතු ආරම්භකර නොතිබුණු අතර මෙම වියදම් කෙරීගෙන යන වැඩ ගිණුමේ දක්වා තිබුණි. මෙම ඉදිකිරීම සඳහා දැනට ඉඩමක් ලැබී ඇති බැවින් ඉදිරි වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කරන බව නිසි බලධාරී විසින් දන්වා තිබුණි.

(ආ) (i) 2008 සැප්තැම්බර් 01 දිනැති පොහොර ලේකම් කාර්යාලයේ අංක 4/5/1 දරන චක්‍රලේඛයේ 4.1 අනුව රාජ්‍ය පොහොර සමාගම් විසින් පොහොර සැපයිය යුත්තේ එක් එක් දිස්ත්‍රික්කය තුල සිය සමාගමට අනුයුක්ත කර ඇති කලාපයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන වලට පමණක් වුවත් 2007/2008 මහ කන්නයේ සිට 2010 පෙබරවාරි 08 දක්වා පොහොර මෙ.ටොන් 41,571.45 ප්‍රමාණයක් කොමර්ෂල් පොහොර සමාගම විසින් ප්‍රාදේශීය තොග බෙදුම්කරුවකු වෙත ලබාදී තිබුණි.

(ii) 2009 ඔක්තෝබර් 30 දිනැති අංක 4/5/1 දරණ ජාතික පොහොර ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂකගේ චක්‍රලේඛ ලිපියට අනුව හුණුපිටිය ප්‍රධාන ගබඩාවේ සිට පොහොර නිකුත්කිරීමේදි පොහොර කි්.ග්‍රෑ. 50 මල්ලක මිල රු. 300 කට වඩා අඩු නොවිය යුතු ලෙස උපදෙස් ලබාදී තිබියදිත්, ඉහත බෙදුම්කරු වෙත පොහොර ලබාදමේදි පොහොර මල්ලක වටිනාකම රු. 300 ට වඩා අඩුවෙන් ලබාදී තිබුණි.

(iii) පොහොර ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන පොහොර බෙදාහැරීමේ සැලැස්මට අනුව ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත බෙදාහැරීමට නියම කරන ලද පොහොර ප්‍රමාණයට වඩා වැඩිපුර පොහොර මෙ.ටොන් 1272.17 ක ප්‍රමාණයක් 2009 ඔක්තෝබර් සිට 2010 ජනවාරි දක්වා කාලය තුල පොහොර සමාගම විසින් එම බෙදුම්කරු වෙත අලෙවිකර තිබුණි.

(ඇ) බටඅත ප්‍රාදේශීය ගබඩාව සඳහා 2007 ඔක්තෝබර් 29 දින සිට 2009 මාර්තු 31 දින දක්වා, රු.255,000 ක් බදු ගෙවා තිබුණද, අයිතිය තහවුරු කළ නොහැකි පුද්ගලයකුට මෙම මුදල ගෙවා තිබුණි. එහෙත් 2009 මාර්තු 31 දිනෙන් පසුව කිසිදු මුදලක් ගෙවා නොතිබුණ අතර, ඒ වෙනුවෙන් බදුකුලී වෙන්කිරීමක් හෝ කර

නොතිබුණද, තවමත් එම ස්ථානයේ ගබඩාව පවත්වාගෙන යනු ලබන බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී රු.277,337,774 ක් වටිනා පොහොර තොගවිධිමත් ණය ගිවිසුමකින් තොරව ණය පදනම මත පෞද්ගලික ආයතන වලට සපයා තිබුණි.

### 2.2.3 අරමුණු වලට පටහැනි ගෙවීම්

---------------------------------

සමාගමේ අරමුණට පටහැනිව විවිධ ආයතනවලට රු. 2,721,123 ක මුදලක් පරිත්‍යාග හා ආධාර ලෙස දරා තිබණි.

### 2.2.4 නිශ්ක්‍රීය වත්කම්

--------------------

දිනකට මෙට්‍රික් ටොන් 480 ක් පොහොර මිශ්‍ර කර නිපදවිය හැකි වටිනාකම රු.3,750,000 ක් වූ පොහොර මිශ්‍රණ යන්ත්‍ර 3 ක් ගබඩා සංකීර්ණයේ ස්ථානගතව පැවති අතර එම යන්ත්‍ර සහනාධාර පොහොර වැඩසටහන ක්‍රියාත්මක වූ පසුව උපයෝජනය කර තිබුණේ ඉතාමත් අඩු ධාරිතාවයක් පමණක් වන අතර, 2008/2009 හා 2009/2010 වර්ෂ තුළ මෙම යන්ත්‍ර 03 න් කිසිදු ප්‍රයෝජනයක් ගෙන නොතිබුණි.

### 2.2.5 හඳුනාගත් පාඩු

------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ජාතික පොහොර ලේකම් කාර්යාලයේ වැඩ බලන අධ්‍යක්ෂගේ 2008 පෙබරවාරි 07 දිනැති අංක 4/5/5/එෆ්එස්/2007/2008 දරන ලිපියට අනුව ගොවිජනසේවා මධ්‍යස්ථාන වෙත පොහොර මිටියක් රු.330 කට අලෙවි කළයුතු වුවත් මඩකලපුව නගරය වෙත රු.314 කට පොහොර ප්‍රවාහනය කිරීමට කොමර්ෂල් පොහොර සමාගමේ නිසි බලධාරී විසින් අනුමත කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළද සමාගමට රු. 3,027,594 ක අලාභයක් සිදු වී තිබුණි.

(ආ) කොළඹ කොමර්ෂල් පොහොර සමාගම විසින් පොහොර ලබාදීමේ ද සමාන්‍යයෙන් ලබාදෙනු ලබන වට්ටම් අනුපාතයට වඩා වැඩි වට්ටම් ප්‍රමාණයක් බෙදාහැරීමේ නියෝජිතයකු වෙත ලබාදීම හේතුවෙන් සමාගමට 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා අහිමිවූ ආදායම රු. 31,443,782 ක් විය.

### 2.2.6 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම

----------------------------------------------

2006 වර්ෂයේදී සකස් කරන ලද 2006 - 2011 දක්වා වූ සංයුක්ත සැලැස්ම සමාගමේ අවශ්‍යතාවයන් අනුව වාර්ෂිකව සංශෝධනය කර නොතිබුණු අතර වාර්ෂිකව සකස් කරනු ලබන ක්‍රියාකාර සැලැස්ම හා සංයුක්ත සැලැස්ම අතර විශාල වෙනස්කම් පැවතුණි.

### 2.2.7 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම් හා වියදම් අතර සැලකියයුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව දක්නට ලැබුණි.

## 3. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සමාගමේ නිසි බලධාරියාගේ අවධානයට යොමු කරන ලදී. පහත දැක්වෙන පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) වාහන පාලනය
(ආ) ණයගැති පාලනය
(ඇ) ස්ථාවර වත්කම් පාලනය
(ඈ) තොග පාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය